දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන - (දෙවන අයි මාර්ග) - 2024

දෙවන ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහනේ (දෙවන අයි මාර්ග) 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2017 නොවැම්බර් 22 දින එළැඹි අංක 3579 එස්ආර්අයි සහ අංක 3580 එස්ආර්අයි (සීඕඑල්) ණය ගිවිසුම්, 2019 නොවැම්බර් 13 දින එළැඹි අංක 3851 එස්ආර්අයි ණය ගිවිසුම, 2021 මැයි 28 දින එළැඹි අංක 4067 එස්ආර්අයි යන ණය ගිවිසුම සහ 2023 නොවැම්බර් 28 එළැඹි 4384 එස්ආර්අයි ණය ගිවිස්මවල IV ව්‍යවස්ථාවේ 4.03 වගන්තිය සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 වැඩසටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සහ වැඩසටහනේ කාලය

වැඩසටහනේ ණය ගිවිසුම්වලට අනුව, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, වර්තමානයේ ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය වැඩසටහන ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩසටහනේ අරමුණ වන්නේ, ග්‍රාමීය ප්‍රජාව සහ සමාජ ආර්ථික මධ්‍යස්ථාන අතර මාර්ග ප්‍රවේශතාවය වැඩිදියුණු කිරීමය. මෙහි දිගුකාලීන බලපෑම වන්නේ ජාතික හා පළාත් මාර්ගවල ප්‍රවාහන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම වේ. ණය ගිවිසුම්වලට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 165,185 කට සමාන එ.ජ.ඩො. මිලියන 1,084.60 ක් වන අතර ඉන් රු.මිලියන 137,070 කට සමාන එ.ජ.ඩො. මිලියන 900 ක් මූල්‍යනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. ඉතිරි මුදල රු.මිලියන 28,115 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂිතය. ණය නියෝජිතායතනය ඔවුන්ගේ සාමාන්‍ය ණය නිදහස් කිරීමේ ක්‍රමවේදය යටතේ කොටස් තුනක් මගින් එ.ජ.ඩො. මිලියන 900 න් එ.ජ.ඩො. මිලියන 500 ක් නිදහස් කර තිබුණු අතර සාර්ව ආර්ථික අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස ක්‍රියාවලිය අත්හිටුවා තිබුණි. පසුව, අයි මාර්ග සහ දෙවන අයි මාර්ග වැඩසටහන් දෙකෙහිම දැනටමත් ආරම්භ කර ඇති සහ වැඩ අවසන් නොකළ මාර්ගවල අත්‍යාවශ්‍ය පුනරුත්ථාපන කටයුතු සිදු කිරීම සහ සිදු කරන ලද පෙර වැඩ සඳහා ගෙවීම් පියවීමට මෙම වැඩසටහනේ 4 වන අදියර යටතේ තවත් එ.ජ.ඩො. මිලියන 60 ක් ලබා දීමට තීරණය කර තිබුණි. වැඩසටහන එහි කටයුතු 2018 ජූලි 20 දින ආරම්භ කරන ලද අතර 2027 මාර්තු 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2.1 වගන්තියේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2024 දෙසැම්බර් 31 දිනට වැඩසටහනෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස, මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන   ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- වැඩසටහනෙහි අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.1 ගිණුම්කරණ අඩුපාඩු

	ගිණුම්කරණ අඩුපාඩුව	මුදල රු.මිලියන	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	ඉංජිනේරුවරයා විසින් සහතික කරන ලද රු. මිලියන 161.36 ක් වටිනා සහතිකවලට අදාළ අතුරු ගෙවීම්, සමාලෝචනයට භාජනය වන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල කොන්ත්‍රාත්කරුවන්ට සහ උපදේශකයින්ට ගෙවිය යුතු ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, කොන්ත්‍රාත්කරුවන්ට සහ උපදේශකයින්ට ගෙවිය යුතු ගෙවීම් සහ කෙරීගෙන යන වැඩ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	161.36	අනාගත මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීමට උපදෙස් දෙනු ලැබේ.	තෝරාගත් මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූල බවට ගණකාධිකාරීවරයා සහතික විය යුතුය.
(ආ)	රු. මිලියන 216.68 ක රඳවා ගැනීම්, ගෙවිය යුතු රඳවා ගැනීම් සහ සිවිල් වැඩ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු දෑ යන දෙකෙහිම ඇතුළත් කර තිබුණි. එම හේතුවෙන්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් සහ කෙරීගෙන යන වැඩ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	216.68	එය 2025 ජ'නල් සටහන් අංක JE/25/67 මගින් නිවැරදි කර ඇත.	තෝරාගත් මූල්‍ය වාර්තාකරණ රාමුවට අනුකූල බවට ගණකාධිකාරීවරයා සහතික විය යුතුය.
(ඇ)	සමාලෝචිත වර්ෂයේ කොන්ත්‍රාත් පැකේජ 03 කට අදාළව කොන්ත්‍රාත් ලේඛනයේ ඇතුළත් කර තිබුණු ඉංජිනේරුවරයා සහතික කළ රු. මිලියන 40.09 ක් වූ අතුරු ගෙවීම් සහතික (අ.ගෙ.ස.) 3 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, කෙරීගෙන යන වැඩ, මහ බැංකුවට (ම.බැ.) ගෙවිය යුතු දෑ සහ රඳවා ගැනීම් පිළිවෙලින් රු. මිලියන 40.09 කින්, රු. මිලියන 28.08 කින් සහ රු. මිලියන 3.83 කින් අඩුවෙන් දක්වා තිබුණි.	40.09	මෙම අ.ගෙ.ස. ගෙවීම්වලට අදාල ම.බැ. අයදුම්පත් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.	මූල්‍ය ප්‍රකාශනවල නිරවද්‍යතාවය පිළිබඳව ගණකාධිකාරීවරයා සහතික විය යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 05 හි 43 (අ) ඡේදයට අනුව, එම වත්කම් සහ වගකීම්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අවසාන දිනයේ පැවති විදේශ විනිමය අනුපාතයට පරිවර්තනය කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ වැඩසටහන මගින් විනිමය අනුපාත වෙනස්කම් ගැලපීම් කර (parity adjustment) හෝ අනාවරණය කර නොතිබුණි.	-	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබා දී ඇති උපදෙස් අනුව, ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශනවල විනිමය අනුපාත වෙනස්කම් ගැලපීම් කිරීම අවශ්‍ය නොවේ.	අදාල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුගත වියයුතුය.

(ඉ)	පිරිවැය හිමිකම්පෑම් (Cost claim) සඳහා කරන ලද ප්‍රතිපාදන වටිනාකම වූ රු. මිලියන 14,087.80 ක් ඉංජිනේරුවරයා විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශනවල කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ලෙස ගිණුම්ගත කර ඇති රු. මිලියන 3,489.50 ක ඉතිරි පිරිවැය හිමිකම් පෑම් සම්බන්ධයෙන් වත්මන් බැඳීම්වල නිශ්චිත බව විගණනයට තහවුරු කර නොතිබුණි. එම හේතුවෙන්, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	14,087.50	සිවිල් වැඩ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු වන්දි සඳහා ප්‍රතිපාදනයක් ලෙස වැරදි ලෙස සටහන් කර ඇති ඉංජිනේරුවරයා විසින් ප්‍රතික්ෂේප කරන ලද පිරිවැය හිමිකම්පෑම් 2025 දී ජ'නල් සටහන් අංක JE/25/68 මගින් නිවැරදි කර ඇත.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(c) වගන්තියේ විධිවිධානවලට අනුකූලව සමාලෝචනය කිරීමේදී විශේෂ අවධානය යොමු කළ යුතු අතර ලිඛිත උපදෙස් නිකුත් කළ යුතුය.
(ඊ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 08 හි 22 වන ඡේදයට අනුව, වර්තමාන බැඳීමක් තිබීම, බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවයන් ඇතුළත් සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය වීම සහ බැඳීම් ප්‍රමාණය පිළිබඳව විශ්වාසදායක ඇස්තමේන්තුවක් කළ හැකිනම් පමණක් ප්‍රතිපාදන සිදුකළයුතුය. කෙසේ වෙතත්, අදාළ තොරතුරු විගණනය සඳහා ලබා ගත නොහැකි වීම හේතුවෙන්, රු. මිලියන 907 ක් වූ ආරවුල් විනිශ්චය මණ්ඩලය (DAB) සහ බේරුම්කරණ හිමිකම් පෑම් (Arbitration claims) ලෙස සිදු කරන ලද ප්‍රතිපාදනයන්හි නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.	907.00	මෙම කොන්ත්‍රාත්කරුවන්ගේ හිමිකම් පෑම් අත්හිටවන ලද කොන්ත්‍රාත් සහ ඒ ආශ්‍රිත හිමිකම් පෑම් වේ. බේරුම්කරණයන් සිදුකරමින් පවතී.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුගත වියයුතුය.
(උ)	අයකර නොගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සඳහා වන ප්‍රතිපාදනය වූ රු. මිලියන 1,201.37 ක් අවිනිශ්චිත අයකරගැනීම් ලෙස වෙනම සඳහන් කළ යුතුය. කෙසේ වෙතත්, එය කොන්ත්‍රාත්කරුවන්ට සහ උපදේශකයින්ට ගෙවිය යුතු ලෙස ගිණුම්ගත කර තිබුණි. එම නිසා, කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු මුදල සහ කෙරීගෙන යන වැඩ එම ප්‍රමාණයයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	1,201.37	අවසන් කරන ලද කොන්ත්‍රාත්තුවල අයකර නොගත් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සඳහා ප්‍රතිපාදන වෙන වෙනම ගිණුම්ගත කර ඇත.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුගත වියයුතුය.
(ඌ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 හි 97 සහ 98 ඡේදවලට අනුව, බැඳීමේ ස්වභාවය ආදී පිළිබඳව කෙටි විස්තරයක් හෙළිදරව් කළ යුතුය. කෙසේ වෙතත්, ප්‍රමාද පොලිය සඳහා රු. මිලියන 571.96 ක ප්‍රතිපාදන සම්බන්ධයෙන් අදාළ හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.	571.96	2023 මුල් භාගයේදී සිවිල් වැඩ අත්හිටුවා තිබූ අතර ප්‍රමාණවත් අරමුදල් නොමැතිකම හේතුවෙන් අතුරු ගෙවීම් සහතික කිහිපයක ගෙවීම් අත්හිටුවා තිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුගත වියයුතුය.

2.2 **නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම**

	නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව	**අනුකූල නොවීම**	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**විගණකගේ නිර්දේශය**
(අ)	2020 පෙබරවාරි 28 දිනැති රාජ්‍ය මුල්‍ය චක්‍රලේඛ අංක 01/2020.	වැඩසටහන මගින් පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණ පිළිබඳ වාර්තාව පළාත් කාර්යාලවල වාර්තා සමඟ ඉදිරි වර්ෂයේ ජූනි 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය සඳහා අදාළ වාර්තාව 2025 ජූලි 09 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.	භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් කර වාර්තාව ඉදිරිපත් කර ඇත.	චක්‍රලේඛ උපදෙස් අනුව භාණ්ඩ සමීක්ෂණ සිදු කළ යුතුය.
(ආ)	2019 මාර්තු 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි 9.3 වගන්තිය	ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක්වත් රැස්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.	2024 අගෝස්තු 02 සහ 2024 නොවැම්බර් 08 යන දිනවල මෙහෙයුම් කමිටු රැස්වීම් දෙකක් පවත්වා ඇත.	මෙහෙයුම් කමිටු රැස්වීම් අදාළ චක්‍රලේඛවලට අනුකූලව පවත්වන බවට ප්‍රධාන ගනන්දීමේ නිලධාරියා විසින් සහතික විය යුතුය.
(ඇ)	2019 ජනවාරි 12 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/01/2019	ව්‍යාපෘති අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටුවක් ස්ථාපිත කළ යුතු අතර වාර්ෂිකව අවම වශයෙන් රැස්වීම් 04 ක් පැවැත්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේ එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අයි මාර්ග වැඩසටහනේ අභ්‍යන්තර විගණක තනතුර අහෝසි කර ඇත. එබැවින් වැඩසටහනේ අභ්‍යන්තර විගණන කාර්යය නිසි ලෙස ඉටු කර නොතිබුණි.	අදාළ චක්‍රලේඛවලට අනුකූලව අභ්‍යන්තර විගණන සමාලෝචන කමිටු රැස්වීම් පවත්වන බවට ප්‍රධාන ගනන්දීමේ නිලධාරියා විසින් සහතික විය යුතුය.

3. භෞතික කාර්යසාධනය

3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

(අ) මාර්ග දිග

සංරචකය	**ක්‍රියාකාරකම**	**2024 දෙසැම්බර් 31 දිනට**		**විගණන නිරීක්ෂණය**	**ප්‍රමාදය සඳහා හේතු**
		අපේක්ෂිත භෞතික කාර්යසාධනය කි.මී.	**ලභාකරගත් කාර්යසාධනය කි.මී.**		
ජාතික සහ ග්‍රාමීය මාර්ග	ජාතික මාර්ග ග්‍රාමීය මාර්ග	කි.මී. 340 කි.මී. 3400	කි.මී. 120.31 කි.මී. 2447.21	2024 දෙසැම්බර් 31 දින වන විට, වැඩසටහන මඟින් ජාතික මාර්ග	බොහෝ කොන්ත්‍රාත්කරුවන්

ප්‍රතිසංස්කරණ කටයුතු සම්පූර්ණ කිරීම	කි.මී. 340 කින් සහ ග්‍රාමීය මාර්ග කි.මී. 3400 කින් පිළිවෙලින් ජාතික මාර්ග කි.මී. 120.31 ක් සහ ග්‍රාමීය මාර්ග කි.මී. 2,447.21 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි.	තම වැඩ අත්හිටුවා ඇති අතර, කොන්ත්‍රාත්කරුවන් ගේ දුර්වල කාර්යසාධනය, කොන්ත්‍රාත් ගෙවීම් ප්‍රමාද වීම, දුර්වල ප්‍රගතියට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	එකඟවේ.
විගණකගේ නිර්දේශය	ව්‍යාපෘතිය නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහ අයවැයක් සකස් කළ යුතු අතර ඒ අනුව වගකීම් නියම කළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ විධිවිධානවලට අනුකූලව සිදු කරන සමාලෝචනයේදී උපදෙස් නිකුත් කළ යුතුය.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
(අ)	කොන්ත්‍රාත් කොන්දේසිවලට අනුව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් බැඳුම්කර සහ කාර්ය සාධන බැඳුම්කර මුදල් කිරීම සම්බන්ධයෙන් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. විස්තර පහත දැක්වේ වේ.		
(i)	2024 දෙසැම්බර් 31 වන විට, අත්හිටවන ලද පැකේජ 06 කින් රු. මිලියන 1,445.06 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්, මුදල් කරගැනීම සඳහා වැඩසටහන මඟින් ඉල්ලීම් බැංකුවට ඉදිරිපත් කර තිබුණි. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්කරුවන් එම බැඳුම්කර මුදල් කිරීමට එරෙහිව අධිකරණ නියෝග ලබාගෙන තිබුණු බැවින් බැඳුම්කර මුදල් බවට පත් කරගෙන නොතිබුණි.	බැඳුම්කර කිහිපයක් මුදල් බවට පත් කරගන්නා ලද අතර, වැඩිදුර ක්‍රියාමාර්ග සඳහා බේරුම්කරණයට යොමු කරන ලදී.	අත්තිකාරම් බැඳුම්කර මුදල්කර ගැනීමට වහාම පියවර ගත යුතු අතර, වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව පියවර ගත යුතුය.
(ii)	2024 දෙසැම්බර් 31 දිනට පැකේජ 10 ක රු. මිලියන 885.75 ක අයවියයුතු වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්වලින් වර්ෂය තුළදී අයවීම් සිදු නොවුණි.	මෙයින් රු. මිලියන 37.73 ක් අයකර ගන්නා ලද අතර අනෙකුත් කොන්ත්‍රාත් පැකේජවලට අදාළ බැඳුම්කර තවමත් ක්‍රියාත්මක තත්ත්වයේ පවතී.	අත්තිකාරම් බැඳුම්කර මුදල්කර ගැනීමට වහාම පියවර ගත යුතුය.
(ආ)	වැඩ නිම කිරීමට පිළිගත හැකි හේතූන් මත කාලය දීර්ඝ කිරීම් (EOT) සඳහා කොන්ත්‍රාත්කරුට හිමිකම් ඇත. පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.		
(i)	මුලික කොන්ත්‍රාත් කාලය අවසන් වීමට පෙර හෝ කලින් අනුමත කරන ලද කාල දීර්ඝ කිරීම් අවසන්වීමට පෙර	කොන්ත්‍රාත්කරුවන් විසින් ලේඛන සැපයීමේ	කොන්ත්‍රාත් කොන්දේසි වල ඇතුලත් උපදෙස්

	කොන්ත්‍රාත්කරු කාලය දීර්ඝ කිරීම් සඳහා අයදුම් කළ යුතු වුවද, 2024 වර්ෂය තුළ ක්‍රියාත්මකව පැවති කොන්ත්‍රාත් 19 ක කොන්ත්‍රාත්කරුවන් දින 09 සිට දින 889 ක් දක්වා ප්‍රමාදිතව කාලය දීර්ඝ කිරීම් සඳහා ඉල්ලුම් කර තිබූ බව නිරීක්ෂණය විය.	ප්‍රමාදය කාලය දීර්ඝ කිරීම් වල සැලකිය යුතු ප්‍රමාදයන්ට හේතු විය.	අනුගමනය කළ යුතුය.
(ii)	මුලික කොන්ත්‍රාත් කාලය හෝ කලින් අනුමත කරන ලද කාල දීර්ඝ කිරීම් අවසන් වීමට පෙර, කාලය දීර්ඝ කිරීම් අනුමත කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මකව පැවති කොන්ත්‍රාත්තු 7 ක ඉංජිනේරුවරයා විසින් කාලය දීර්ඝ කිරීම් අනුමත කිරීම දින 129 සිට දින 732 දක්වා ප්‍රමාදිතව සිදුකර තිබූ බව නිරීක්ෂණය විය. තවද, ඉංජිනේරුවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලද ඉතිරි කොන්ත්‍රාත්තු 12 හි කාල දීර්ඝ කිරීම් 2025 මැයි 31 වන විටත් අනුමත කර නොතිබුණි.	කොන්ත්‍රාත්කරුවන් විසින් ලේඛන සැපයීමේ ප්‍රමාදය කාලය දීර්ඝ කිරීම් වල සැලකිය යුතු ප්‍රමාදයන්ට හේතු විය.	කොන්ත්‍රාත් කොන්දේසි වල ඇතුලත් උපදෙස් අනුගමනය කළ යුතුය.
(ඇ)	2023 ජූලි 13 දිනැති රාජ්‍ය වියදම් සමාලෝචන කමිටුවේ (PERC) නිර්දේශ 4.1.6 ට අනුව, පුනරුත්ථාපනය කිරීම දැනටමත් ආරම්භ කර ඇති මාර්ග, ඉදිරි මධ්‍ය කාලය තුල මෝටර් රථ ධාවනය කළ හැකි මට්ටම දක්වා අවසන් කිරීමට නිර්දේශ කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ මාර්ග ප්‍රගතිය අනුව, අත්‍යාවශ්‍ය කාර්යයන් ඉටුකිරීමේ වැඩසටහනට (Critical works program) ඇතුළත් නොවූ ග්‍රාමීය මාර්ග 520 ක සහ ජාතික මාර්ග 26 ක මාර්ග භාරදීම් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	මෙ සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් සති දෙකක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබේ.	කමිටුවේ නිර්දේශවලට අනුකූල විය යුතු අතර කමිටුවේ නිර්දේශවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය.
(ඇ)	2023 මාර්තු 31 දිනට ප්‍රගති වාර්තාවට අනුව මාර්ග 91 ක් සම්පූර්ණයෙන්ම නිම කර ඇති බවට හඳුනාගෙන තිබුණද, 2024 ජනවාරි 01 දිනට අනුමත කරන ලද අත්‍යාවශ්‍ය කාර්යයන් ඉටුකිරීමේ වැඩසටහන (Critical Work Programme) යටතේද එම මාර්ග ඇතුළත් කර තිබුණු බව නිරීක්ෂණය විය.	අදාළ පළාත් කාර්යාල සමඟ පරීක්ෂා කිරීම අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් සවිස්තර වාර්තාවක් සති දෙකක් ඇතුළත ඉදිරිපත් කරනු ලැබේ.	අත්‍යාවශ්‍ය කාර්යයන් ඉටුකිරීමේ වැඩසටහන සකස් කිරීමට පෙර නිසි ඇගයීමක් සිදු කළ යුතුය.

3.3 ව්‍යාපෘති අරමුණු වලට පටහැනිව සිදු කරන ලද ගෙවීම්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට ණය මුදලින් භාවිතා නොකළ ශේෂය මත වැඩසටහන විසින් රු. මිලියන 94.03 ක සමුච්චිත ප්‍රයාපන ගාස්තුවක් (Commitment charges) ණය නියෝජිතායතනයට අනාර්ථික ලෙස ගෙවා තිබුණි.	සැලසුම් කළ කාල සීමාව තුළ ණය වාරික භාවිතා කිරීමෙන්, ප්‍රයාපන ගාස්තු අවම කර ගත හැකිය.	වැඩසටහන විසින් නිසි ක්‍රියාකාරී සැලැස්මක් සහ අයවැයක් සකස් කළ යුතු අතර, ප්‍රයාපන ගාස්තු අවම කිරීම සඳහා ඒ අනුව වගකීම් නිශ්චය කළ යුතුය. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ විධිවිධාන අනුව සිදු කරනු ලබන සමාලෝචනයේදී විශේෂ අවධානය යොමු කර උපදෙස් ලබා දිය යුතුය.
(ආ)	කොන්ත්‍රාත් කොන්දේසි 108.4 සහ 120.7 උප වගන්තිවලට අනුව,	මෙම ක්‍රමය යටතේ දරන ලද වියදම සාපේක්ෂව	කොන්ත්‍රාත්තුවේ විශේෂ කොන්දේසි බලාත්මක කිරීමට පෙර ප්‍රවේශමෙන් සමාලෝචනය කළ යුතුය.

වැඩසටහන අවසානයේ සියලුම රසායනාගාර, ගෘහ භාණ්ඩ සහ මැනුම් උපකරණ කොන්ත්‍රාත්කරු වෙත ආපසු ලබා දෙනු ලැබුවද, රසායනාගාර, ගෘහ භාණ්ඩ සහ මැනුම් උපකරණ සඳහා පිළිවෙලින් රු. මිලියන 518.99 ක් සහ රු. මිලියන 14.13 ක් එකවර ගෙවා තිබුණි. මේ අනුව, වාසිදායක කොන්ත්‍රාත් කොන්දේසි කොන්ත්‍රාත්කරුවන්ට අනවශ්‍ය ප්‍රතිලාභ ලබා දීමට හේතු විය හැකි බව එයින් නිරීක්ෂණය විය.	අඩු අගයක් ගනු ඇත. තවද, මා.සං.අධි. සතුව දැනට ප්‍රමාණවත් තරම් රසායනාගාර උපකරණ ඇති අතර එවැනි උපකරණ ගබඩා කිරීම සඳහා ඉඩකඩ ද නොමැත.	සේවායෝජක අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම, ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී මුදලට අගය තබා ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව සහ ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසු ලේඛන සමාලෝචනය කිරීමේදී විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

3.4 ඌන උපයෝජිත සම්පත්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	විගණකගේ නිර්දේශය
(අ)	සාමාන්‍යයෙන්, සම්පූර්ණ ණය මුදල ණය නියෝජිතායතනය විසින් බහු විධ මූල්‍ය පහසුකම (Multi-Tranche-Finance Facility) යටතේ වරින් වර කොටස් කිහිපයකින් නිදහස් කරනු ලැබේ. 2021 ට පෙර ඔවුන්ගේ නිත්‍ය ගෙවීම් ක්‍රමයට අනුව, ණය නියෝජිතායතනය ඩොලර් මිලියන 900 න් ඩොලර් මිලියන 500 ක් කොටස් තුනක් යටතේ මුදා හැර තිබුණි. 2021 ඔක්තෝබර් 06 දිනට ණය අංක. 3580-SRI (COL) වසා දමා තිබුණද, එකඟ වූ ණය ශේෂය වන එ.ජ. ඩොලර් මිලියන 60 න් එ.ජ. ඩොලර් 139,761.22 ක් ණය පහසුකම වසා දැමීමට පෙර සම්පූර්ණයෙන් ප්‍රයෝජනයට ගෙන නොමැති බව නිරීක්ෂණය විය.	අංක 3580 – SRI (COL) ණය මුදල එ.ජ.ඩො. 59,860,238.78 ක අඩු මුදලකින් අවසන් කෙරිණි.	නියමිත කාල සීමාව තුළ ණය පහසුකම භාවිතා කිරීමට වැඩසටහන සැලසුම් කළ යුතුය.
(ආ)	2021-2023 කාලය තුළ ඇති වූ සාර්ව ආර්ථික අර්බුදය හේතුවෙන් ණය නියෝජිතායතනය විසින් ණය ලබා දීමේ ක්‍රියාවලිය අත්හිටුවන ලදී. පසුව, 2023 ඔක්තෝබර් 09 දිනැති අංක 23/1830/608/070-II දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ, දැනටමත් ආරම්භ කර ඇති සහ අසම්පූර්ණ මාර්ග කොටස්වල අත්‍යාවශ්‍ය කටයුතු, ආරම්භ නොකළ මාර්ග නඩත්තු කිරීම සහ මෙම අයි මාර්ග වැඩසටහන් දෙකටම අදාළව සිදු කරන ලද පෙර වැඩ සඳහා ගෙවීම් කිරීම සඳහා වැඩසටහනේ 4 වන කොටස යටතේ එ.ජ. ඩොලර් මිලියන 60 ක් ලබා දීම සඳහා අත්‍යාවශ්‍ය වැඩ සඳහා වූ ණය ගිවිසුමක් අත්සන් කරන ලදී. අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව, අසම්පූර්ණ මාර්ග 1019 න් අත්‍යාවශ්‍ය වැඩ වැඩසටහනට මාරු කරන ලද ග්‍රාමීය මාර්ග 804 ක් සහ ජාතික මාර්ග 11 ක් ප්‍රතිසංස්කරණය කිරීමට තීරණය කර තිබුණි. 2024 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 6,454.95 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් හිඟහිටිව තිබුණද, වැඩ අත්හිටුවන ලද පැකේජ සහ අත්‍යාවශ්‍ය වැඩ වැඩසටහනට ඇතුළත් නොවූ පැකේජ සඳහා පිළිවෙලින් රු. මිලියන 1,445.06 ක සහ රු. මිලියන 692.71 ක තවදුරටත් හිඟ වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය විය.	අරමුදල් සීමාවන් හේතුවෙන් බොහෝ කොන්ත්‍රාත්වල විෂය පථය සීමා කරන ලදී. කොන්ත්‍රාත්කරුවන්ගේ කැමැත්ත ඇතිව, හිඟහිට ඇති අතුරු ගෙවීම්, රඳවා ගැනීම් ආදිය මගින් පියවා ගැනීමෙන් අත්තිකාරම් අයකර ගැනීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය කොන්ත්‍රාත්කරුවන් සමඟ සාකච්ඡා කිහිපයක් සිදු කර ඇත.	ඇපකර මුදල් බවට පත් කිරීමට වහාම පියවර ගත යුතු අතර විධිමත් පරීක්ෂණයක් පවත්වා අලාභය අය කර ගත යුතුය.

(ඇ)	වැඩසටහන යටතේ 4 වන කොටස සඳහා 2023 නොවැම්බර් 28 දින අත්සන් කරන ලද ණය ගිවිසුමට අනුව, දැනටමත් වැඩ ආරම්භ කර ඇති එහෙත් වැඩ අවසන් නොකළ මාර්ග කොටස්වල අත්‍යාවශ්‍ය කටයුතු සඳහා සහ පෙර සිදු කරන ලද වැඩ සඳහා ගෙවීම් කිරීමට අයි මාර්ග වැඩසටහන් දෙක සඳහා එ.ජ. ඩොලර් මිලියන 60 ක මුදලක් ලබා දී තිබුණි. 2024 දෙසැම්බර් 31 වන විට රු. මිලියන 10,294.06 කට සමාන එ.ජ. ඩොලර් මිලියන 60 න් එ.ජ. ඩොලර් මිලියන 33.56 ක් මුදාහැර තිබුණි. එයින් 2024 දෙසැම්බර් 31 වන විට අයි මාර්ග වැඩසටහනේ සිවිල් වැඩ සඳහා රු. මිලියන 4,594.82 ක මුදලක් වැය කර තිබුණි.	ආසියානු සංවර්ධන බැංකුව විසින් අනුමත කර සමාලෝචනය කරන ලද මුදාහැරීමේ සැලැස්ම, අයවැය පාලනයන් සහ අත්‍යාවශ්‍ය වැඩ සැලැස්මට අනුව, 4 වන කොටසේ ණය මුදල් මුදාහැරීම සහ භාවිතය සිදු කරන ලදී.	අමතර පිරිවැය වළක්වා ගැනීම සඳහා ණය මුදල් නිසි ලෙස භාවිතා කළ යුතුය.

3.5 මතභේදාත්මක ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	2023 ජුලි 13 දින නිකුත් කරන ලද රාජ්‍ය වියදම් සමාලෝචන කමිටු වාර්තාවට අනුව, වැඩසටහන යටතේ ඉදිරි මධ්‍ය කාලය තුළ දැනටමත් වැඩ ආරම්භ කර ඇති මාර්ග මෝටර් රථ ධාවනය කළ හැකි තත්ත්වයට පත් කිරීමට නිර්දේශ කළද, ඉහත කමිටු තීරණවලට පටහැනිව රු.මිලියන 321.71 ක් වූ කි.මී. 9.02 ක දිගින් යුතු නව (වැඩ ආරම්භ නොකළ) මාර්ග 04 ක් පුනරුත්ථාපනය කිරීම වැඩසටහන විසින් ආරම්භ කර තිබුණු බව නිරීක්ෂණය විය.	2020 දී අයි මාර්ග වැඩසටහනට භාර දුන් සියලුම මාර්ග වසර තුනක් තුල පුනරුත්ථාපන කටයුතු සිදු නොකළ අතර දැඩි ලෙස හානිවී ඇත. එම නිසා මෙම මාර්ගවල අත්‍යාවශ්‍ය කටයුතු සිදු කිරීමට සිදු විය.	කමිටු නිර්දේශවලට අනුකූලව කටයුතු කළයුතු අතර නිසි අධිකාරියක් නොමැතිව නව ග්‍රාමීය මාර්ග තෝරා ගැනීම පිළිබඳව පරීක්ෂණයක් පැවැත්විය යුතුය.
(ආ)	**ස්වාධීන උපදේශකයින් පත් කිරීම** උපදේශන ගිවිසුමේ 32 වන ඡේදයට පටහැනිව 2024 ජුනි 06 දින තොරතුරු තාක්ෂණ නිලධාරියෙකු ස්වාධීන උපදේශකයෙකු ලෙස පත් කර තිබුණු අතර නැගෙනහිර පළාත් මාර්ග පුනරුත්ථාපන උපදේශන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපදේශන-05 හි අතුරු ගෙවීම් සහතිකවලින් 2024 ජුනි සිට අගෝස්තු දක්වා කාලය සඳහා වේතනය ලෙස රු. 499,500 ක මුදලක් ගෙවා තිබුණි. තවද, අදාළ නිලධාරියා අමාත්‍යාංශ ලේකම් කාර්යාලයේ රාජකාරිවලට අනුයුක්ත කර තිබුණි. තවද, මෙම නිලධාරියා 2024 සැප්තැම්බර් 09 සිට 14 දක්වා ඉන්දියාවේ පැවති මහනුවර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය පිළිබඳ නියමු ව්‍යාපෘතියේ පුහුණු වැඩසටහනක ඉහළ මට්ටමේ නිලධාරියෙකු ලෙස සහභාගී කරවා තිබුණි.	පත් කරන ලද තොරතුරු තාක්ෂණ නිලධාරියා ස්වාධීන උපදේශකයෙකු නොවේ. ඇය අයි මාර්ග වැඩසටහන සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපදේශක අතර වූ උපදේශන ගිවිසුම යටතේ ප්‍රධාන නොවන විශේෂඥවරියක් ලෙස බඳවාගෙන ඇත.	පහසුකම් පරිපාලන අත්පොතට අනුකූල විය යුතු අතර අනුකූල නොවීම් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය.
(ඇ)	ණය නියෝජිතායතනයේ 2023 මාර්තු සිට මැයි දක්වා වූ විශේෂ ව්‍යාපෘති පරිපාලන සමාලෝචනයෙන් (Mission) පසුව, සීමිතව අරමුදල් සපයන ඊලග ණය වාරිකයේදී තීරණාත්මක සහ අත්‍යාවශ්‍ය ඉතිරි මාර්ග කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා වැඩසටහන සමඟ කටයුතු කිරීමට එකඟ වී තිබුණි. ඒ අනුව, ණය නියෝජිතායතනය විසින් එ.ජ. ඩොලර් මිලියන 60 ක 4	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව, ව්‍යාපෘති වටිනාකම එ.ජ. ඩොලර් 250 සිට එ.ජ. ඩොලර් මිලියන 60 දක්වා අඩු කරන ලදී. ඒ අනුව, කාර්ය මණ්ඩල වැටුප් සහ දීමනා	නව පත්වීම් පිළිනොගත් නිලධාරීන්ට වැටුප් ගෙවීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය.

	වන වාරිකය නිදහස් කරන ලද අතර අදාළ ණය ගිවිසුම 2023 නොවැම්බර් 28 දින අත්සන් කරන ලදී. මෙම ණය වාරික මුදල 2023 දෙසැම්බර් 4 දින සිට බලාත්මක විය. 2024 මාර්තු 15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 මගින් ලබා දී ඇති උපදෙස් අනුව සහ 2024 ජනවාරි 03 දිනැති අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කරන ලද අංක DMS/7777/IROAD-III ලිපිය මගින් තවදුරටත් පැහැදිලි කර ඇති පරිදි, වැඩසටහන් යටතේ මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු බොහොමයක් අවසන් කර ඇති බැවින්, එකඟ වූ මූල්‍ය වටිනාකම වන එ.ජ. ඩොලර් මිලියන 60 මත පදනම්ව ව්‍යාපෘති කාර්ය මණ්ඩලය තීරණය කළ යුතු බව අවධාරණය කරන තිබුණි. තවද, මෙම වැඩසටහන් සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් අනුමත කර තිබූ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය අහෝසි කර ඇති අතර, ඒ සඳහා අලුතින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු බව දන්වා තිබුණි. එබැවින්, 2023 අවසානයට පෙර සිදු කරන ලද පත්වීම්, වැඩසටහන් කාර්ය මණ්ඩලයේ සියලුම සේවා කොන්ත්‍රාත්තු 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් විය. රේඛීය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන) විසින් 2024 මාර්තු 31 දක්වා කාර්ය මණ්ඩලයේ වැටුප් ගෙවීමට අනුමැතිය ලබා දී තිබුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2024 මාර්තු 04 දිනැති අංක DMS/7777/IROAD-III ලිපිය මගින් නව සේවක සංඛ්‍යාව අනුමත කර ඇති අතර 2024 ජුනි 05 දිනැති අංක DMS/7777/IROAD-III ලිපිය මගින් තවත් ව්‍යාපෘති ඉංජිනේරු තනතුරු 06 ක් (PS 4 කාණ්ඩය යටතේ) සඳහා අතිරේක අනුමැතියක්ද ලබා දී තිබුණි. එම පත්වීම් නිලධාරීන් විසින් පිළිගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 4 වන පරිශිෂ්ඨයට අනුව, ඕනෑම පත්වීමක් රාජකාරි භාරගත් දින සිට ක්‍රියාත්මක වන නමුත්, නව තනතුරු භාර නොගත් නිලධාරීන් 12 දෙනෙකු හට 2024 අප්‍රේල් සිට නොවැම්බර් දක්වා වැඩසටහන මගින් ව්‍යාපෘති දීමනා ලෙස රු. මිලියන 4.51 ක මුදලක් ගෙවා තිබුණි.	විශාල ප්‍රමාණයකින් අඩු කරන ලදී. වැඩසටහනේ දියුණුව සඳහා ඉංජිනේරුවන් තවමත් අයි මාර්ග I සහ II හි සියලුම කටයුතු කරගෙන යනු ඇත.	
(ඇ)	මාර්ග ප්‍රතිසංස්කරණ කටයුතු අතරතුර අදාළ ඉඩම් හිමියන් විසින් ව්‍යාපෘතිය සඳහා ඉඩම් කට්ටි 4075 ක් පරිත්‍යාග කර තිබුණද, ඉඩම් කට්ටි 2752 ක අදාළ අයිතිය පැවරීමට කැමැත්ත ප්‍රකාශිත ලිපි ඇතුලු අනෙකුත් ලිපි ලේඛණ පමණක් අදාල පළාත් පාලන ආයතන වෙත භාර දී ඇති බව නිරීක්ෂණය විය. එබැවින්, පරිත්‍යාග කරන ලද ඉඩම් සම්බන්ධයෙන් ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් නිසි භාරදීමේ ක්‍රියා පටිපාටියක් හඳුන්වා දී ක්‍රියාත්මක කර නොමැති බව නිරීක්ෂණය විය.	පරිත්‍යාග කරන ලද ඉඩම්වල අදාළ ලියකියවිලි, අවසන් කරන ලද මාර්ග සමඟ අදාළ බලධාරීන්ට භාර දීමට කටයුතු කරනු ඇත.	නිසි ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියා පටිපාටියකට අනුකූල වීමට පළාත් පාලන ආයතන දිරිමත් කළ යුතුය.

3.6 උපදේශන සේවා

ප්‍රාදේශීය මාර්ග නඩත්තුව ආවරණය කිරීම සඳහා මාර්ග නඩත්තු භාර අරමුදල (RMTF) පුළුල් කිරීම, ප්‍රාදේශීය මාර්ග නඩත්තු කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියේ වගකීම පුළුල් කිරීම, මාර්ග සංවර්ධන අධිකාරියේ ගිණුම්කරණ ධාරිතාව වැඩිදියුණු කිරීම සඳහා සහාය වීම සහ වැඩසටහන සඳහා විස්තීර්ණ ගිණුම්කරණ සහ මූල්‍ය අත්පොතක් සකස් කිරීම සඳහා වැඩසටහන විසින් 2022 ජනවාරි 03 දින රාජ්‍ය පරිපාලන විශේෂඥයකු සමඟ රු. මිලියන 8.2 ක වටිනාකමකින් යුත් ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	කළමනාකරණයේ ප්‍රතිචාරය	විගණකගේ නිර්දේශය
(අ)	ඉහත උපදේශන සේවාව සඳහා වන ගිවිසුමට අනුව, එය 2023 ජුනි මස අවසානය වන විට අවසන් කළ යුතු අතර රාජ්‍ය පරිපාලන විශේෂඥයාට රු. මිලියන 5.7 ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වෙතත්, යොමුගත නියමයන් (TOR) ප්‍රකාරව ආරම්භක වාර්තාව සහ ගිණුම්කරණ සහ මූල්‍ය කළමනාකරණ අත්පොත පමණක් භාරදී ඇති බව නිරීක්ෂණය විය.	ආර්ථික අර්බුදය සහ 4 වන ණය වාරිකයේ එකඟතාවය සඳහා වූ සාකච්ඡා තාවකාලිකව අත්හිටුවීම යටතේ, උපදේශන සඳහා ගෙවීම් නතර කිරීමට තීරණය කරන ලදී.	යොමුගත නියමයන්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් පියවර ගත යුතුය.
(ආ)	යොමුගත නියමයන්ට අනුව, මෙම අත්පොත ක්‍රියාත්මක කිරීම පිළිබඳව වැඩසටහනේ මූල්‍ය කළමනාකරණ කාර්ය මණ්ඩලයට විධිමත් පුහුණුවක් ලබා දීමට උපදේශකවරයාගෙන් අපේක්ෂා කෙරුණි. කෙසේ වෙතත්, උපදේශකවරයා විසින් ඉහත අවශ්‍යතාව සපුරා නොමැති බව නිරීක්ෂණය විය.	ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග පිළිබඳ අවසන් වාර්තාවක් සහ කාර්තුමය ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.	යොමුගත නියමයන්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් පියවර ගත යුතුය.
(ඇ)	ගිවිසුම් වටිනාකමෙන් සියයට 63 ක් හෙවත් රු. මිලියන 5.17 ක මුදලක් රාජ්‍ය පරිපාලන විශේෂඥයාට ගෙවා තිබුණද, රජයේ ධාරිතාව තක්සේරු කිරීමේ වාර්තාව, ක්‍රියාකාරී සැලසුම් පිළිබඳ වාර්තාව, ප්‍රතිපත්තිමය පියවර පිළිබඳ අවසන් වාර්තාව සහ කාර්තුමය ප්‍රගති වාර්තා යොමුගත නියමයන් (ToR) අනුව ඉදිරිපත් කර නොතිබුණි. එබැවින්, ඉලක්ක සම්පූර්ණ කිරීමේ අසාමාන්‍ය ප්‍රමාදය හේතුවෙන් මෙම කොන්ත්‍රාත්තුව ඵලදායී ලෙස සම්පූර්ණ කිරීම විගණනයේදී සැක සහිත වනු ඇත.	විස්තර කර ඇති පරිදි ඉදිරිපත් කරන ලද වාර්තා සඳහා රු. මිලියන 5.17 ක මුදල ලබා දී ඇති අතර කිසිදු අමතර මුදලක් ගෙවා නොමැත.	යොමුගත නියමයන්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් පියවර ගත යුතුය.